# මූලික පිරිවෙන් ප්‍රථම වාර පරීක්ෂණය - 2019
# Primary Piriven First Term Test - 2019

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## 3 ශ්‍රේණිය

**සාමාන්‍ය විද්‍යාව I , II**

කාලය : පැය 02
Time :

### I පත්‍රය

**සැලකිය යුතුයි:**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

1) බීජ හට නොගන්නා අපුෂ්ප ශාකයක් නොවන්නේ මින් කුමක්ද?
   1) මාකැන්ටියා 2)සෙලජිනෙල්ලා 3)බේදුරු 4) අඹ

2) වෛරසයක් මගින් බෝවන රෝගයකි.
   1) සෙම්ප්‍රතිශ්‍යාව 2)කොළරාව 3)උපදංශය 4) අතීසාරය

3) පෘෂ්ඨවංශීන් කාණ්ඩයක් නොවන්නේ,
   1) මැමේලිය 2)රෙප්ටීලියා 3)නිඩාරියා 4) ඇම්ෆිබියා

4) රතු ග්‍රහයා ලෙස හඳුන්වන ග්‍රහලෝකය වන්නේ මින් කුමක්ද?
   1) බ්‍රහස්පති 2)අඟහරු 3)සෙනසුරු 4) බුධ

5) පෘථිවිය පැතලි වස්තුවක් බව ප්‍රකාශ කල විද්‍යාඥයා වන්නේ,
   1) පයිතගරස් 2)තෙලස් 3)ඇරිස්ටෝටල් 4) සැමෝස්

6) මිථුන තරු රටාවේ දීප්තිමත්ම තාරකාව වන්නේ,
   1) පොලක්ස් 2)සීරියස් 3)ඇල්ෆා සෙන්ටෝරි 4) පොලාරිස්

7) රාශි චක්‍රයට අයත් තරු රටා ගණන,
   1) 10 කි 2) 11 කි 3) 12 කි 4) 13 කි

8) සමනලයාගේ ජීවන චක්‍රයේ අවස්ථාවක් නොවන්නේ,
   1) බිත්තර 2)පිලවා 3)කීටයා 4) ශිශුවා


9) ජෛව ගෝලයේ සංවිධාන මට්ටම් නිවැරදිව අනුපිළිවෙළින් දක්වා ඇත්තේ,
   1) ඒකෙකයා ⟶ ගහනය ⟶ පරිසර පද්ධතිය ⟶ ප්‍රජාව ⟶ ජෛවගෝලය
   2)ඒකෛකයා ⟶ පරිසර පද්ධතිය ⟶ ගහනය ⟶ ප්‍රජාව ⟶ ජෛවගෝලය
   3)ඒකෛකයා ⟶ ගහනය ⟶ ප්‍රජාව ⟶ පරිසර පද්ධතිය ⟶ ජෛවගෝලය
   4) ඒකෛකයා ⟶ ප්‍රජාව ⟶ ගහනය ⟶ ජෛවගෝලය ⟶ පරිසර පද්ධතිය

10) එක් විශේෂයක ජීවියෙකු තම පැවැත්ම සඳහා වෙනත් විශේෂයක ජීවියෙකු ගොදුරු කර ගෙන ආහාරයට ගැනීම,
   1) පරපෝෂිතාව 2)විලෝපීයතාව 3)සහජීවනය 4) තරඟය

- **ප්‍රශ්න 06කට පිළිතුරු සපයන්න.**

## II පත්‍රය

1. පහත දැක්වෙන්නේ  පරිසර පද්ධති තුල ද්‍රව්‍ය චක්‍රීකරණය පිළිබඳව ඇති චක්‍රයකි.




i. මෙහි A හා B නම් කරන්න.
ii. ජලය මගින් සත්වයන්ට ඇති ප්‍රයෝජණ 03 ක් ලියන්න.
iii. ස්වභාවික පරිසරයක පැවැත්ම කෙරෙහි බලපාන අජෛව සාධක 03 ක් ලියන්න. (4+3+3 = 10)
iv.

2. කෙටි පිළිතුරු ලියන්න.

i. බීජ හට නොගන්නා අපුෂ්ප ශාක 02 ක් නම් කරන්න.
ii. පෘෂ්ඨවංශීන් වෙන් කළ හැකි වංශ (කාණ්ඩ) මොනවාද?
iii. මොලුස්කා කාණ්ඩයට අත් ජීවීන් සතු ලක්‍ෂණ 02 ක් ලියන්න.
iv. ක්‍ෂීරපායී ජීවීන් හා මත්ස්‍යයන් අතර ඇති සමානකමක් හා වෙනස්කමක් බැගින් ලියන්න.
v. බැක්ටීරියා මගින් මිනිසාට වැළදෙන රෝග 02 ක් ලියන්න. (2x5 = 10)

3.
i. තරු රටා වල ප්‍රයෝජන 04 ක් ලියන්න.
ii. තාරකා විද්‍යාව සම්බන්ධ දාර්ශනිකයන් තුන්දෙනෙක් නම් කරන්න.
iii. ජෛවගෝලයේ සංවිධාන මට්ටම් තුනක් නම් කර විස්තර කරන්න. (4+3+3 = 10)

4.
i. ලෝක සම්භවය පිළිබඳ බෞද්ධ විග්‍රහ ඇතුලත් සූත්‍රයක් ලියන්න.
ii. රූපාන්තරණය යන්න පැහැදිළි කරන්න.
iii. රූපාන්තරණය බෙදෙන කොටස් නම් කරන්න.
iv. සමනලයාගේ ජීවන චක්‍රය ඇද දක්වන්න. (2+3+2+3=10)

5. ආහාර මගින් දේහයේ විවිධ කෘත්‍ය ගණනාවක් සිදු වීමට අවශ්‍ය ද්‍රව්‍ය සපයන බව අප කවුරුත් දන්නා කරුණකි.

i. ආහාරයක අඩංගු ප්‍රධාන පෝෂක වර්ග 06 ක් ලියන්න
ii. ආහාර මගින් දේහය තුළ  සිදු වන කෘත්‍යයන් 03  ක් ලියන්න.
iii. තුලිත ආහාර වේලක් යනු කුමක්දැයි හදුන්වා දී එහි ස්වභාවය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (3+3+4=10)

6.
i. ආහාර ජීර්ණ පද්ධතියේ මූලික කොටස් 06 ක් ලියන්න.
ii. ආහාර ජීර්ණ පද්ධතියේ ප්‍රධාන කාර්යය කුමක්ද?
iii. ආහාර ජීර්ණ පද්ධතිය ආශ්‍රිත රෝග 02 ක් නම් කර ඉන් එක් රෝගයක් පිළිබඳ විස්තර කරන්න. (3+3+4=10)

7. ජීවියෙකුගේ දේහයේ හදුනාගත හැකි සංවිධාන මට්ටම් ගැලිම් සටහනකින් දක්වන්න.

i. ශාක සෛල හා සත්ත්ව සෛලවල ඇති වෙනස්කම් 02 ක් ලියන්න.
ii. ශාක පත්‍රයක ඇති වැදගත් ස්ථානයක් ලෙස මෘදුස්ථර පටකය හැඳින්විය හැක. මෘදුස්ථර පටකයේ කෘත්‍යයන් ලියන්න. (3+4+3=10)